# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

| 11 ශ්‍රේණිය | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | 1 ඒකකය |
|---|---|---|

## වෙළඳාම හා උපකාරක සේවා

❖ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

## I - කොටස

- **වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

01. කමල් කොළඹ මල්ශාලාහිමියන්ට කුඩා ප්‍රමාණවලින් මල් විකිණීම.

(1). සිල්ලර වෙළඳාමකි
(2). තොග වෙළඳාමකි
(3). විදේශ වෙළඳාමකි
(4). බහු වෙළඳාමකි

02. බලපත්‍රලාභී වාණිජ බැංකුවකි,

(1). ශ්‍රී ලංකා මහ බැංකුව
(2). ලංකා බැංකුව
(3). ජාතික ඉතිරි කිරීමේ බැංකුව
(4). ජාතික සංවර්ධන බැංකුව

➢ **පහත සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න අංක 03 සහ 04 ට පිළිතුරු සපයන්න.**

සම්පත් බැංකුවේ ජංගම ගිණුමක් ඇති නදිනි ගුණසේකර තම සැපයුම්කරුවෙකු වන නිමල් ජයසිංහගෙන් මිලදී ගත් භාණ්ඩ වෙනුවෙන් රු. 100 000 ක චෙක්පතක් නිකුත් කරන ලදි. එම චෙක්පත නිමල් ජයසිංහ විසින් බැංකු කවුන්ටරයෙන් මුදල් කර ගත්තේය.

03. මෙම චෙක්පතේ අණකරු හා ආදායකයා පිළිවෙලින් දැක්වෙන පිළිතුරු කාණ්ඩය තෝරන්න.

(1). නිමල් පෙරේරා හා සම්පත් බැංකුව
(2). නදිනි ගුණසේකර හා නිමල් ජයසිංහ
(3). සම්පත් බැංකුව හා නදිනි ගුණසේකර
(4). සම්පත් බැංකුව හා නිමල් ජයසිංහ

04. මෙම සිද්ධියට අදාළව නිකුත් කරන ලද චෙක්පත,

(1). සාමාන්‍ය රේඛනය සහිත චෙක්පතකි
(2). රේඛනය නොකළ චෙක්පතකි
(3). විශේෂ රේඛනය සහිත චෙක්පතකි
(4). බැංකු ජංගම ගිණුමක තැන්පත් කළ හැකි චෙක්පතකි

05. ශවීන්ගේ ජංගම ගිණුමේ ඔහු විසින් කරන ලද මුදල් හා චෙක්පත් තැන්පත් කිරීම්වලට අමතරව විවිධ මාර්ගවලින් ලැබෙන ආදායම් වර්ග බැරවී ඇත. මේවා හඳුන්වන්නේ,

(1). බැංකු අයිරා ලෙස ය
(2). ස්ථාවර නියෝග ලෙස ය
(3). බැංකු ගාස්තු ලෙස ය
(4). සෘජු ප්‍රේෂණ ලෙස ය

06. තම පියාට අයත් මෝටර් රථය තමාගේ ව්‍යාපාර කටයුතු සඳහා යොදා ගන්නා සමන්, එම රථය තමාගේ නමින් රක්ෂණය කිරීමට අයදුම්පතක් රක්ෂණ සමාගමට ඉදිරිපත් කරන ලදි. රක්ෂණ සමාගම එය ප්‍රතික්ෂේප කර ඇත. මෙයට හේතු වූ මූලධර්මය වනුයේ,

(1). රක්ෂණ හිමිකම
(3). හානිපූරණය
(2). උපරිම විශ්වාසය
(4). දායකත්වය

07. රක්ෂණය සම්බන්ධ පළමු පක්ෂය ..........(1).......... වන අතර දෙවෙනි පක්ෂය ..........(2).......... ලෙස හැඳින්වේ. මෙහි (1) හා (2) හිස්තැන්වලට ගැළපෙන වඩාත් නිවැරදි පිළිතුර පිළිවෙළින්,

(1). රක්ෂකයා, රක්ෂිතයා
(3). රක්ෂිතයා, රක්ෂකයා
(2). රක්ෂකයා, රක්ෂණ ආයතනය
(4). රක්ෂණ ආයතනය, රක්ෂිතයා

08. විද්‍යුත් තැපැල් පණිවුඩය,

(1). බාහිර විද්‍යුත් ලිඛිත සන්නිවේදන ක්‍රමයකි
(2). බාහිර විද්‍යුත් වාචික සන්නිවේදන ක්‍රමයකි
(3). අභ්‍යන්තර විද්‍යුත් වාචික සන්නිවේදන ක්‍රමයකි
(4). අභ්‍යන්තර ලිඛිත සන්නිවේදන ක්‍රමයකි

09. මාතර සිට කොළඹට මීකිරි ප්‍රවාහනය කිරීම සඳහා සපුමල් දුම්රිය මාධ්‍යය යොදා ගැනීමට තීරණය කළද, නියමිත වේලාවට දුම්රිය නොපැමිණීම නිසා ඔහුට ඒ සඳහා විකල්ප මාධ්‍යයක් තෝරා ගැනිමට සිදුවිය. සුදුසු ප්‍රවාහන මාධ්‍යයක් තෝරා ගැනීමේදී සලකා බලන සාධක අතරින් සපුමල්ට දුම්රිය, මාධ්‍යයක් ලෙස යොදා නොගැනීමට බලපෑ සාධක වන්නේ,

(1). සුලබත්වය
(3). භාණ්ඩයේ ස්වභාවය
(2). වේගය
(4). ධාරිතාව

10. ගුවන් ප්‍රවාහනයේ වාසියක් වනුයේ,

(1). ගමනාන්තය දක්වා යා හැකි වීම
(3). ඕනෑම අවස්ථාවකදී යොදාගත හැකි වීම
(2). පිරිවැය අධික වීම
(4). ඉක්මනින් ළඟා විය හැකි වීම

## II - කොටස

01. i. (අ). වෙළඳාම යනු කුමක්ද?

..........................................................................................................

.......................................................................................................... (ල.1)

(ආ). සිල්ලර වෙළඳාම, තොග වෙළඳාමෙන් වෙනස් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

..........................................................................................................

..........................................................................................................

.......................................................................................................... (ල.2)

ii. ව්‍යාපාර කටයුතුවලට උපකාර වන සේවා දක්වන්න.

..........................................................................................................

.......................................................................................................... (ල.2)

iii. පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද දක්වන්න.

(අ). සිල්ලර වෙළෙන්ඳා පාරිභෝගිකයාට සෘජුවම සම්බන්ධ වේ. ...........................

(ආ). ජාතික ඉතිරිකිරීමේ බැංකුව වාණිජ බැංකුවකි. ...........................

(ඉ). යම් අවශ්‍යතාවක් සඳහා ස්ථාවර තැන්පතුවක මුදල් කල් පිරීමට පෙර ආපසු ලබා ගැනීමට හැකියාවක් නැත. ...........................

(ඊ). අලෙවිය සඳහා පොත් සාප්පුවක් අභ්‍යාස පොත් මිලට ගැනීම සිල්ලර වෙළඳාමකි. ......................

(ල.2)

iv. රෙදිපිළි ව්‍යාපාරිකයකු වන රවී පෙරේරා 2018.10.01 දින රු. 8 500 ක් වටිනා රෙදිපිළි තොගයක් අවන්ත බණ්ඩාර ගෙන් මිලදී ගෙන එම ගෙවීමට අදාළ මුදල ලංකා බැංකු චෙක්පතකින් ගෙවන ලදි. ඉහත සිද්ධියට අදාළව චෙක්පතට සම්බන්ධ පාර්ශව නම් කරන්න.

(අ). ආදායකයා - ........................................................................................................

(ආ). අණලද්දා - ........................................................................................................

(ඉ). අණකරු - ........................................................................................................ (ල.3)

02. i. (අ). 'රක්ෂණය යනු අවදානම් ඒකරාශි කිරීමකි.' මෙය පැහැදිලි කරන්න.

........................................................................................................

........................................................................................................ (ල.2)

(ආ). රක්ෂණ මූලධර්ම දෙකක් ලියා දක්වන්න.

........................................................................................................

........................................................................................................ (ල.1)

ii. ''දේපල රක්ෂණයේ වැදගත්කම'' කරුණු දෙකකින් ලියා දක්වන්න.

........................................................................................................

........................................................................................................ (ල.2)

iii. පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද දක්වන්න.

(අ). දේපල රක්ෂණයේදී අවදානම නිශ්චිත වන අතර ජීවිත රක්ෂණයේදී අවදානම අවිනිශ්චිත වේ. ...........................

(ආ). පුද්ගලයකුට තමාගේ ඥාතියකු රක්ෂණය කළ හැකිය. ...........................

(ඉ). ජීවිත රක්‍ෂණ ඔප්පුව, ණය ලබා ගැනීමේදී ඇපයක් ලෙස භාවිතා කළ හැකිවීම. ..........................

(ඊ). දේපළ රක්ෂණයේ අමතර ප්‍රතිලාභ හිමිවේ. .........................

(ල.2)

iv. නිමල්ගේ රු. 1 500 000 වටිනා මෝටර් රථය ශ්‍රී ලංකා රක්ෂණ සමාගමේ එම වටිනාකමට රක්ෂණය කර තිබූ අතර එම රථය අනතුරට භාජනය වී රු. 500 000 ක අලාභයක් සිදු විය. එම අවස්ථාවේදී මෝටර් රථය නිසා අසල තිබූ තාප්පයටද හානි සිදු විය.

ඉහත සිද්ධියට අදාළව රක්ෂණයට සම්බන්ධ පහත සඳහන් දෑ නම් කරන්න.

(අ). පළමු පාර්ශවය - ........................................................................................................

(ආ). දෙවන පාර්ශවය - ........................................................................................................

(ඉ). තෙවන පාර්ශවය - ........................................................................................................

(ඊ). නිමල්ට ලැබෙන වන්දි මුදල - ........................................................................................................ (ල.3)

03\. i. (අ). ''මත්තල ගුවන් තොටුපල විවෘත කිරීම මගින් විදේශ සබඳතා කටයුතු කාර්යක්ෂම වේ.''

ඉහත ප්‍රකාශයේ සඳහන් ප්‍රවාහනයට සම්බන්ධ වන ප්‍රවාහන මූලිකාංගය නම් කරන්න.

........................................................................................................................ (ල.1)

(ආ). යෝග්‍ය ප්‍රවාහන ක්‍රමයක් තෝරා ගැනීමේදී සැලකිලිමත් වන කරුණු දෙකක් දක්වන්න.

........................................................................................................................

........................................................................................................................ (ල.2)

ii. ව්‍යාපාර කටයුතු සඳහා සන්නිවේදනය වැදගත්වීමට හේතු දෙකක් දක්වන්න.

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................ (ල.2)

iii. පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද දක්වන්න.

(අ). සන්නිවේදන ක්‍රියාවලිය සම්පූර්ණ වීමට ප්‍රතිපෝෂණය අවශ්‍යම නැත. ..........................

(ආ). සෑම ගමනාන්තයක් සඳහාම යොදාගත හැකිවීම ජල මාර්ග ප්‍රවාහනයේ වාසියකි. .........................

(ඉ). ගුවන් සමාගමක් විසින් නව ගුවන් යානා 3 ක් මිලට ගැනීම යන ප්‍රකාශය තුළ ඇතුළත්වන ප්‍රවාහන මූලිකාංගය මාධ්‍යයයි. ..........................

(ඊ). ව්‍යාපාර කටයුතුවලට මෙන්ම අධ්‍යාපනයේදීද සන්නිවේදනය වැදගත් වේ. .........................

(ල.2)

iv. ලංකා සමාගම 2020.02.20 දින පෙ.ව. 10.30 ට රැස්වීම් ශාලාවේදී කළමනාකරණ රැස්වීමක් පැවැත්වෙන බවත් එයට සහභාගී වීම අත්‍යවශ්‍ය බවත් සමාගමේ ප්‍රධාන කළමනාකරු විසින් විද්‍යුත් තැපෑලෙන් අංශභාර කළමනාකරුවන්ට දන්වා ඇත. ඒ අනුව එම රැස්වීමට සහභාගි වන බව අංශභාර කළමනාකරුවන් විසින් විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් සමාගමේ ප්‍රධාන කළමනාකරුට දන්වා ඇත.

ඉහත සිද්ධියේ සන්නිවේදන ක්‍රියාවලිය ගැලීම් සටහනක් ආකාරයෙන් දක්වන්න.

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................ (ල.3)

*සැකසුම : නිසංසලා ගලප්පත්ති මිය*